# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

2014 ජූලි



දාමරික කල්ලියක් විසින් මාධ්‍ය වැඩමුළුවක් කඩාකප්පල් කිරීමට විරෝධය පළ කරනු වස් කැඳවූ මෙම මාධ්‍ය සාකච්ඡාව සම්බන්ධීකරණය කිරීම හේතුවෙන් තමාට එල්ල වූ මරණීය තර්ජන නිදහස් මාධ්‍ය ව්‍යාපාරයෙහි කැඳවුම්කරු සුනිල් ජයසේකර මහතා එම මාධ්‍ය සාකච්ඡාවේදීම පැහැදිලි කරයි
*( ඡායාරූපය: ද සන්ඩේ ටයිම්ස්)*


INFORM
Human Rights Documentation Centre
http://ihrdc.wordpress.com informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

අ. වෘත්තීය සංවිධාන, ආගමික නායකයන් සහ දේශපාලන විශ්ලේෂකයන්ට මරණ තර්ජන, බිය ගැන්වීම සහ හිරිහැර කිරීම

ආ. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම

ඇ. රැස්වීමේ නිදහස උල්ලංඝණය කිරීම

ඇ. සමාගමයේ  නිදහස උල්ලංඝණය කිරීම (රා.නො.සං. බියගැන්වීම සහ නීති පැනවීම)

ඉ. විශ්ව විද්‍යාල ශිෂ්‍ය  මර්දනය

ඊ. එ.ජා පරීක්ෂණය වෙත සාක්ෂි දෙන පුද්ගලයන්ට එරෙහිව පියවර ගන්නා බවට තර්ජන

එ. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන් ම  වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙ හි ශ්‍රීලංකා වේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාතයන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක්ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය,මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාතයන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

## සාරාංශය

ජූලි මාසය ශ්‍රී ලංකාවට “කළු ජූලිය” කි. 1983 ජූලි මාසයේදී ඇති වූ දෙමළ විරෝධී ව්‍යාපාර නිසා ජූලි මාසය කළු ජූලිය නමින් හැඳින්වෙන අතර එකී කෝලහලයේ දී දහස් ගණනක් දෙමළ වැසියන් ඝාතනය කෙරුණු අතර ඔවුන්ගේ දේපළ විශාල වශයෙන් විනාශ කරන ලදී. දෙමළ සටන්කාමී ක්‍රියාකාරකම් සඳහා සහාය ඉහළ නැංවූ සහ දෙමළ ඩයස්පෝරාවේ ආරම්භය සටහන් කළ මේ කෝලාහලය වාර්ගික අර්බුදයේ හැරවුම් ලක්ෂයක් විය. මෙම වසරේ දී පැවැත්වුණු කළු ජූලිය සිහිපත් කිරීමේ වැඩසටහනකට පොලීසියෙන් බාධා එල්ල විය. 1983න් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ දෙවන හානිකර ජාතිවාදී කෝලහලය වූ 2014 ජූනි මාසයේ අලුත්ගම දී මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව ඇති වූ ප්‍රහාරය සිහිපත් කිරීම සඳහා සංවිධානය කළ වැඩසටහනකට ද පොලීසිය විසින් බාධා එල්ල කරන ලදී.

2014 ජූලි මාසය විරුද්ධ මතධාරීනට කළු ජූලියක් ම විය. නීතිඥ සංගමයේ සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නායකයන්, ප්‍රධාන දේශපාන විශ්ලේෂකයෙක් සහ රජය විවේචනය කරමින් කතා කරන කතෝලික රදගුරුවරයෙකු වෙත තර්ජන සහ බිය ගැන්වීම් එල්ල වූ අතර ආවේක්ෂනයන්ට ද ලක්විය. ඒ අතරම ශ්‍රී ලංකාවෙන් පිටුවහල් වී ඕස්ට්‍රේලියාවේ ජීවත් වන සාම ක්‍රියාකාරිකයෙකුට සිය මවගේ අවමගල්‍ය කටයුතු සඳහා ලංකාවට පැමිණීමට වීසා ලබා ගැනීමේ දී විවිධ දුෂ්කරතා වලට මුහුණ පාන්නට සිදුවිය. සිනමාකරුවනට තර්ජන එල්ල වූ අතර දෙමළ ජනමාධ්‍යවේදීන් ගණනාවකට තර්ජනයන්ට, ප්‍රශ්ණ කිරීම් වලට මෙන්ම ආරක්ෂක හමුදාවන් විසින් සිදු කළා යැයි කියන ලිංගික අතවර සහ නිති විරෝධී ලෙස ඉඩම් අල්ලා ගැනීම් ආදිය පිළිබඳ වාර්තා කිරීමේදී විවිධ බාධාකිරීම් වලට මුහුණ දෙන්නට සිදු විය. අල් ජසීරා මාධ්‍ය ජාලයේ ප්‍රකට ජන මාධ්‍යවේදියෙකු ද ප්‍රශ්ණ කිරීම් වලට ලක් විය. පුහුණු වැඩමුළුවක් සඳහා කොළඹ බලා පැමිණෙමින් සිටි දෙමළ ජනමාධ්‍යවේදීන්ට මධ්‍යම රාත්‍රියේ දී පොලීසිය සහ හමුදාව විසින් බාධා එල්ල කරන ලදී. පුහුණුව පැවැත්වීමට සූදානම් කර තිබූ ගොඩනැගිල්ල ඉදිරිපිටට පැමිණි කලහකාරී පිරිසකගේ තර්ජන හේතුවෙන් මෙම පුහුණු වැඩමුළුව පසුව නවතාලන ලදී. යාපනයේ සංවිධානය කර තිබූ විරෝධතා රැළියක්ද පොලීසිය විසින් ලබා ගත් අධිකරණ නියෝගයක් මත තහනම් කරන ලදී.

රාජ්‍ය නොවන සංවිධාන වලට ද ජූලි මාසය කළු ජූලියක් ම විය. ආරක්ෂක අමාත්‍යංශය යටතේ පවතින රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය නොවන සංවිධාන වලට මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීම, මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම සහ ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීම තහනම් කරමින් චක්‍රලේඛණයක් නිකුත් කළේය. රාජ්‍ය නොවන සංවිධාන වලට ආධාර ලබා දීම සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කරන වෙනත් ආයතන වලට අනතුරු හඟවමින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ද නිවේදනයක් නිකුත් කළේය. ආරක්ෂක අමාත්‍යංශයෙන් එල්ල වූ විරෝධතා හේතුවෙන් ඡන්ද දායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වූ ආධාර නවතා දැමීමට USAID ආයතනයට සිදු විය. රාජ්‍ය නොවන සංවිධාන ජාතික ආරක්ෂාවට තර්ජනයක් බවටත් ඔවුන් ත්‍රස්තවාදයට සහය දුන් බවටත් රාජ්‍ය පාලිත මාධ්‍ය මෙන්ම අගමැතිද චෝදනා කළෝය. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර පරීක්ෂණ මණ්ඩලය සමග සහයෝගයෙන් කටයුතු කරන

පුද්ගලයන් පිළිබඳව රජය නැවත වතාවක් සිය විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර ස්කයිප් තාක්ෂණය ඔස්සේ සාක්ෂි ලබා දෙන විදේශ ගත වී සිටින ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගන්නා බවට රජයේ නිල ප්‍රකාශක තර්ජනය කළේය.

ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්තඩංගුවට ගැනුණ අතර මහේස්ත්‍රාත් වරයා විසින් ඇප ලබා දීමෙන් අනතුරුව ඔවුන් නිදහස් කර ගැනීම සඳහා ඥාතීන්ට විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය. තෙවැනි වතාවටත් ශිෂ්‍ය විරෝධතාවයකට ප්‍රහාර එල්ල වූ අතර ශිෂ්‍ය සංගම් විසුරුවා හරින ලදී.

පොලීසියේ රැකවරණය ලද කණ්ඩායමක් විසින් සිය ගමන අවහිර කළ බව තොරතුරු සොයා බැලීමේ චාරිකාවක නිරත වූ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කියා සිටියහ.

පසුගිය වසර කිහිපය තුළ ජනමාධ්‍යවේදීන්ට කිසිදු ප්‍රහාරයක් එල්ල නොවූ බව ආරක්ෂක මාධ්‍ය ප්‍රකාශක කියා සිටියේ ය. සීමා පැනවීමේ චක්‍රලේඛනය රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ "මාර්ගෝපදේශයක්" පමණක් බව පෙන්වීමට ඇතැම් රජයේ නියෝජිතයින් විසින් උත්සහ කරන ලදී. බෙහෝ දුරටම පොලීසිය විසම්මුතිය මර්දනය කිරීමේ කොටස්කරුවන් බවට පත් විය. නැත්නම් ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ඍජු සහ තීරණාත්මක ක්‍රියාමාර්ග ගැනීමෙන් වැළකී සිටීමට සහ ප්‍රතිචාර නොදැක්වීමට වගබලා ගත්හ.

කෙසේ වුවත් මර්ධනයට ලක් වූ වන් එයට විරුද්ධ ව දිරිමත් ප්‍රතිචාරයන් දැක්වූහ. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැදවුම්කරු සුනිල් ජයසේකර මරණ කර්ජන එල්ල වීමෙන් පසු වුවද මරණ තර්ජන පිළිබඳ හෙළිදරව් කරමින් "මරණ තර්ජන වලින් අපේ ගමන නැවැත්විය නොහැකි" බව ප්‍රකාශ කරමින් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලදී. තමන් වෙත එල්ල වූ බිය ගැන්වීම් සහ ආවේක්ෂනයන්ට බඳුන් වීම පිළිබඳ හෙළිදරව් කිරීමට නීතිඥ සංගමයේ සභාපති වරායා ද ඉදිරිපත් වූ අතර බාධා කිරීම් සහ තර්ජනයයන්ට ලක් වූ මාධ්‍යවේදීන් රාශියක් ද එම තර්ජනයන් ප්‍රසිද්ධ කළහ. යාපනයේ පැවැත්වීමට නියමිතව තිබූ විරෝධතා රැළිය වැළැක්වීමෙන් පසු ඔව්හු පොදු ශාලාවකදී විපතට පත්වූවන්, ආගමික නායකයින් සහ විපක්ෂයේ දේශපාලඥයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් රැස්වීමක් පැවැත්වූහ. ප්‍රශ්ණ කිරීම සඳහා පොලීසියට කැඳවනු ලැබූ සිනමාකරුවෙකු සිය මූලික අයිතිවාසිකම් පෙන්වා දෙමින් එම කැඳවීම ප්‍රතික්ෂේප කළේය. කිසිදු නෛතික පසුබිමක් නොමැති බව පෙන්වා දෙමින් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් නිකුත්කළ චක්‍රලේඛනය නීතිඥවරුන් විසින් ඉවත ලන ලදී. ඒ අතරම රාජ්‍ය නොවන සංවිධාන වල නියෝජිතයින්, ඒ පිළිබඳ සැළකිල්ලක් දක්වන පුද්ගලයින් සහ කණ්ඩායම් මෙම චක්‍ර ලේඛනයේ පිටපත් ප්‍රසිද්ධියේ පුළුස්සා දමන ලදී. මර්දනයට ලක්වූවන් සහ අවධානමට ලක් වී ඇති පුද්ගලයන් විද්‍යාමාන කළ ධෛර්ය සහ අධිෂ්ඨානය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් පිළිබඳ වූ බලාපොරොත්තුව ජීවමාන කරවයි.

## අ. වෘත්තීය ආයතන, ආගමික නායකයන් සහ දේශපාලන විශ්ලේෂකයන්ට මරණ තර්ජන, බිය ගැන්වීම සහ හිරිහැර

### 1. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම් කරුට මරණ තර්ජන

ජූලි 26 වන දා පැවැත් වූ මාධ්‍ය සාකච්ඡාවක් අමතමින් මාධ්‍ය සාකච්ඡාවට පැය කිහිපයකට පෙර තමන්ට දුරකතනයෙන් මරණ තර්ජන එල්ල කළ බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු සුනිල් ජයසේකර මහතා පැවසීය. උතුරේ දෙමළ ජනමාධ්‍යවේදීන් සඳහා කොළඹදී පැවැත්වීමට සූදානම් කරන ලද වැඩමුළුවක් කඩාකප්පල් කිරීම හෙලා දැකීම සහ ඒ පිළිබඳ විරෝධය දැක්වීම සඳහා මෙම මාධ්‍ය සාකච්ඡාව හදිසියේ කැඳවා තිබුණි. "මෙය සිදුවුණේ මාධ්‍ය ආයතන වලට මාධ්‍ය සාකච්ඡාව පිළිබඳ අප (නිදහස් මාධ්‍ය ව්‍යාපාරය) දැනුම් දී පැය දෙකක් පමණක් ගතවීමෙන් පසුවයි. මාධ්‍ය ආයතන වලට මාධ්‍ය සාකච්ඡාව පිළිබඳ දැනුම් දී දෙපැයකට පසුව සැගවූ අංකයක් සහිත දුරකතනයකින් අමතා මගේ නම කුමක්දැයි විමසුවා. මාව හඳුන්වා දීමෙන් අනතුරුව, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මෙම මාධ්‍ය සාකච්ඡාව පැවැත්වුව හොත් මා හට ජීවත් වීමට ඉඩ නොදෙන බව කියමින් පැහැදිළි කටහඬකින් එක එල්ලේ ම තර්ජනය කළා. මාව මරා දමන බව පැහැදිළිව ප්‍රකාශ කළා.[1]" මාධ්‍ය සාකච්ඡව අවසන් වීමෙන් පසුව සුනිල් ජයසේකර මහතා වෙත මරණ තර්ජන ඇතුළත් දුරකතන ඇමතුම් 7ක් පමණ ලැබී ඇති බව ශ්‍රී ලංකා බ්‍රීෆ් විසින් නිකුත් කරන ලද හදිසි දැනුම්දීමක සඳහන් විය. [2]

### 2. නීතිඥ සංගමයේ සභාපති පසුපස තර්ජනාත්මක ලුහු බැඳීමක්

ජූලි 15 වන දින නීතිඥ සංගමයේ සභාපති උපුල් ජයසූරිය මහතා පැය ගණනාවක් තිස්සේ නාඳුනන කණ්ඩායමක් විසින් (මෝටර් සයිකලයක් සහ ත්‍රී රෝද රථයක්) ලුහුබැඳ තිබේ. ජයසූරිය මහතා නීතියේ ආධිපත්‍ය උල්ලංඝණය කිරීම, ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයක් අනිසි ලෙස යොදා ගැනීම සහ ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය සෝදාපාළුවට ලක් වීම පිළිබඳව ප්‍රබලව සහ නිර්භීතව කතා කර ඇත. ජයසූරිය මහතා මේ පිළිබඳව එදිනම කුරුදුවත්ත පොලීසියට පැමිණිළි කර ඇති බව නීතිඥ සංගමය විසින් නිකුත් කළ මාධ්‍ය නිවේදනයක සඳහන් විය: "සිවිල් සමාජ සංවිධාන, මානව හිමිකම් ආරක්ෂකයින් සහ රජය විවේචනය කරන පුද්ගලයන් අධිසොදිසි කරන විධිමත් රටාවක් අපි අත් දැක් ඇත්තෙමු," නීතිඥ සංගමයේ සභාපති වෙත එල්ල වූ මෙම තර්ජන ශ්‍රී ලංකාවේ නීතිය සහ සාමය බිඳවැටීම පිළිබඳව පැහැදිළි සංඥාවක් බව ඒ නිවේදනයේ වැඩි දුරටත් සඳහන් වියග[3]

[1] http://srilankabrief.org/2014/07/lets-stand-together-death-threats-will-not-deter-us-fmm/#more-19110 [accessed August 22, 2014]
[2] http://srilankabrief.org/wp-content/uploads/2014/07/Sri-Lanka-Brief-Alert-Press-Freedom-activist-under-threat.pdf [accessed August 22, 2014]
[3] http://srilankabrief.org/2014/07/lawyers-collective-condemns-move-to-intimidate-the-president-of-the-basl-and-calls-for-an-impartial-investigation/ [accessed August 22, 2014]

**3. නීතිඥ සංගමයේ සභාපතිගේ නිවස සැක කටයුතු පුද්ගලයන්ගේ නිරීක්ෂණයට ලක් වෙයි.**

තලංගම පිහිටා ඇති සිය නිවස අසල හඳුනා නොගත් යතුරු පැදිකරුවන් ගැවසුණු බව නීතිඥ සංගමයේ සභාපති ජයසූරිය මහතා තලංගම පොලීසියට කළ දෙවැනි පැමිණිල්ලෙන් කියා සිටියේය.[4] ජූලි 15 සහ 17 වන දිනයන්හිදී ජයසූරිය මහතගේ අසල්වාසීන් විසින් සැක සහිත යතුරුපැදිකරුවන් දෙදෙනෙක් නිරීක්ෂණය කර ඇති බව ජූලි 18 වන දින තලංගම පොලීසියේ සටහන් කළ එම පැමිණිලේ සඳහන් විය.

**4. රායප්පු ජෝසප් රදගුරුතුමාගේ වෛරී සහගත කතාව සම්බන්ධයෙන් පියවර ගන්නට තිබුණා - ආරක්ෂක ලේකම්.**

වෛරී සහගත කතාව යන්නට නිර්වචනයක් තිබුණා නම් තමාට රදගුරු රායප්පු ජෝසප්ට විරුද්ධව පියවර ගැනීමට ගත හැකිව තිබුණු බව ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඩේලි මිරර් පුවත්පත සමග කළ සාකච්ඡාවකදී ප්‍රකාශ කළේය. "වෛරී සහගත ප්‍රකාශයක් යන්න කුමක්දැයි වෙන්කර හඳුනා ගැනීම ඉතාම අපහසුයි. එය හඳුනාගැනීම සඳහා නිර්වචනයක් තිබුණා නම් සෑහෙන කාලයකට පෙර මම රදගුරු රායප්පු ජෝසප්ට විරුද්ධව පියවර අරගෙන "[5] රදගුරු රායාප්පු ජෝසප්, දෙමල ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයේන් රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළිබඳව දේශීය සහ විදේශීය ආයතන වලට දන්වමින් ඍජුවම රජය විවේචනය කර ඇත. ඔහු දෙමළ සිවිල් සමාජ සංසදයේ සභාපතිද වෙයි.

**5. ප්‍රධාන විරුද්ධ මතධාරියෙක් බිය ගැන්වීමට උත්සාහයක්**

රජයේ ඇතැම් ක්‍රියාකාරකම් විවේචනය කරන ජනමාධ්‍යවේදීන්, සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් සහ දේශපාලඥයින් බිය ගැන්වීමට රාජ්‍ය අනුග්‍රහය සහිතව වැඩසටහනක් ක්‍රියාත්මක වන බව එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මංගල සමරවීර මහතා පැවසීය. එවැනි සිදුවීම් ගණනාවක්ම සිදුවී ඇති බවත් ඇතැම් ක්‍රියාකාරීන් ඔවුන්ගේ අසල්වැසියන් ලවා බිය ගැන්වීමට කටයුතු කරන බව ඔහු තවදුරටත් පැවසීය. ප්‍රවීන සාහිත්‍යධරයෙකු වන ගාමිණී වියන්ගොඩ මහතා පිළිබඳ තොරතුරු විමසීමට පොලිස් අපරාධ විමර්ශන අංශය විසින් ඔහුගේ අසල්වැසියන්ට දුරකතන ඇමතුම් ලබා දී ඇති බව ශ්‍රී ලංකා මිරර් වාර්තා කළේය.[6]

---

4 http://srilankabrief.blogspot.ro/2014/07/sri-lanka-unidentified-motorcyclists_20.html#more [accessed August 22, 2014]
5 http://www.dailymirror.lk/top-story/49090-if-proven-i-will-resign-gota.html [accessed August 22, 2014]
6 https://www.srilankamirror.com/news/16078-cid-operation-to-intimidate-critics-of-govt [accessed August 22, 2014]



ගාමිණී වියන්ගොඩ ප්‍රවීණ රචකයෙකු සහ ප්‍රජාතන්ත්‍රවාදය අගයන ක්‍රියාධරයෙකි (ඡායාරූපය - ෆේස් බුක්)

### 6. රටින් පිටුවහල් වී සිටින සාම ක්‍රියාකාරිකයෙකු හට රටට ඇතුළු වීමට අවහිරතා

ඕස්ට්‍රේලියාවේ ජීවත් වන ප්‍රකට ශ්‍රී ලාංකික සාම ක්‍රියාකාරිකයෙකු වන ලයනල් බෝපගේ[7] මහතා සිය මවට අවසන් ගෞරව දැක්වීමට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා වීසා අයදුම් කළ අවස්ථාවේදී ඔහුට නොයෙකුත් සීමාකිරීම් සහ ප්‍රමාදයන්ට මුහුණ දීමට සිදු විය. මීට වසර 20ට පමණ පෙර ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වී මේ වන විට ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ලබා ගෙන ඇති බෝපගේ මහතා යුධ සමයේ සහ ඉන් පසු කාලය තුළ යුක්තිය සහ සාධාරණත්වය මත පදනම් වූ සාමයක් වෙනුවෙන් ඕස්ට්‍රේලියාව තුළ මෙන්ම ශ්‍රී ලංකාව තුළද ක්‍රියාකාරී වූවෙකි. ජූලි 1 වන දින ඔහු සහ ඔහුගේ බිරිඳ ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා වීසා අයදුම් කර ඇත. ඔවුන් අන්තර්ජාලයෙන් වීසා අයදුම් කර මිනිත්තු කිහිපයකින් ඔහුගේ බිරිඳ වෙත වීසා නිකුත් වුවද සිය වීසා ලබා ගැනීමට බෝපගේ මහතාට දින කිහිපයක් බලා සිටීමට සිදු වී ඇත. අවසානයේදී දේශපාන සාකච්ඡා සහ වැඩමුළු ආදියට සහභාගී නොවන බවට කොන්දේසි සහිතව ඔහු වෙත වීසා නිකුත් කර ඇති බව තතු දන්නා පාර්ශවයක් ඉන්ෆෝම් වෙත කියා සිටියේය. බෝපගේ මහතා ශ්‍රී ලංකාවට පැමිණෙන තුරු ඔහුගේ මවගේ අවමගුල් කටයුතු දින කිහිපයක් ප්‍රමාද කිරීමට ද සිදු වී ඇත.

## ආ. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම්

### 7. අල් ජසීරා වාර්තාකරු සී.අයි.ඩී යේ ප්‍රශ්ණ කිරීමට ලක් වෙයි

අළුත්ගම ප්‍රදේශයේ ඇවිලී ගිය ජාතිවාදී කෝලහලය වාර්තා කිරීම සම්බන්ධයෙන් අල් ජසීරා හි කොළඹ අන්තර්ජාල ජනමාධ්‍යවේදියෙකු වන දිනුක් කොළඹගේ මහතාගෙන් අපරාධ විමර්ශන

---

[7] බොපගේ මහතාගේ ලිපි කියැවීමට http://groundviews.org/author/lionel/ [accessed August 22, 2014]

අංශය මගින් පැය හතරක් පමණ ප්‍රශ්ණ කළ බව ඔහුගේ නීතීඥවරු ප්‍රකාශ කර තිබුණි. ඔහු විසින් පල කළ පුවත් පත් වාර්තා වල සඳහන් වූ, ප්‍රචණ්ඩ ක්‍රියා පැවති කාලය තුළ සිදු වූ මරණ සංඛ්‍යාව තහවුරු කර ගැනීම සඳහා මේ ප්‍රශ්ණ කිරීම සිදු කළ බව බීබීසි සන්දේශය වෙත ප්‍රකාශයක් කරමින් පොලිස් ප්‍රකාශක ජේෂ්ඨ පොලිස් අධිකාරී අජිත් රෝහණ මහතා කියා සිටියේය. අල් ජසීරා මාධ්‍ය ජාලය සහ කොළඹගේ මහතා අතර පවත්නා සම්බන්ධය පිළිබඳ ඔහුගෙන් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කළ බව ඔහුගේ නීතීඥවරු තවදුරටත් ප්‍රකාශ කළහ.[8]

## 8. සමාජ ජාල වලට විරුද්ධව දැඩි ක්‍රියාමාර්ග

ඇතැම් කණ්ඩායම් ප්‍රජාවන් අතර අසමගිය වර්ධනය කරන අරමුණින් විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රජාව අතර ප්‍රචණ්ත්වය වර්ධනය වන ආකාරයේ අසත්‍ය පණිවුඩ එස්එම්එස් සහ සමාජ ජාල හරහා බෙදා හරින බවත් ඒ පිළිබඳව අමාත්‍යංශයේ අවධානය යොමුව ඇති බවත් ආරක්ෂක අමාත්‍යංශයේ වෙබ් අඩවියේ දැක්වුණු නිවේදනයකින් අනතුරු හඟවා තිබුණි. එවැනි පණිවුඩ වල කිසිදු සත්‍යයතාවයක් නොමැති අතර ජනතාව අතර අසමගිය ඇති කිරීමේ ද්වේශ සහගත අරමුණින් එවැනි අසත්‍ය තොරතුරු බෙදා හරින කණ්ඩායම් සහ පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට අදාල ආයතන දැනුවත් කර ඇතැයි ද ප්‍රචණ්ඩ ක්‍රියා වලට පෙළඹවීම වෙනුවෙන් එවැනි පුද්ගලයන් අත්අඩංගුවට ගත යුතු යැයි ද එහි සඳහන් විය.[9]

## 9. උතුරේ දෙමල ජනමාධ්‍යවේදීන්ට කොළඹ පැමිණීමට බාධා

ජූලි 25 රාත්‍රී/ 26 පාන්දර කොළඹ බලා පැමිණෙමින් සිටි උතුරේ ජනමාධ්‍ය වේදීන් 11 දෙනෙකුගේ ගමන ශ්‍රී ලංකා පොලීසිය සහ බුද්ධි අංශ එකාබද්ධව කළ මෙහෙයුමක් මගින් අවහිර කර තිබුණි. මොවුන් කොළඹ බලා පැමිණෙමින් සිටියේ ඩිජිටල් මාධ්‍යකරණයේ ආරක්ෂාව පිළිබඳ සාකච්ඡාවක් සහ වැඩමුළුවක් සඳහාය. ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා වූ රයිටිස් නව් සාමූහිකය සහා යාපනය මාධ්‍ය සමාජය (Jaffna Press Club) විසින් මෙම වැඩමුළුව සංවිධානය කර තිබුණි. මාධ්‍ය වෘත්තිකයන්ගේ ස්වාධීන සාමූහිකයක් වන යාපනය මාධ්‍ය සමාජය ජනමාධ්‍යවේදීන්ගේ සුභසාදනය සහ බල ගැන්වීම අරමුණු කර ගත් ලියාපදිංචි සංවිධානයකි.[10]

## 10. රජය විසින් සංවිධානය කළ කලහකාරී කල්ලියකින් ජනමාධ්‍ය වැඩමුළුවකට අවහිරතා

යාපනයේ ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් ජූලි 26 වන දින ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතනයේ දී පැවැත්වීමට නියමිතව තිබූ වැඩමුළුව කලහකාරී කණ්ඩායමක් විසින් කඩාකප්පල් කරන ලද අතර එලෙස රජය විසින් මෙහෙයවන ලද කලහකාරී කණ්ඩායම් හරහා ජනමාධ්‍ය බිය ගැන්වීම ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන් ගේ සංගමය විසින් හෙලා දකින ලදී. යාපනයේ ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් ඩිජිටල් මාධ්‍ය කරණයේ සුරක්ෂිතතාව පිළිබඳව ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේදී එදින වැඩමුළුවක්

8 http://lankanewsweb.net/news/8130-cid-quizzes-al-jazeera-journalist [accessed August 22, 2014]
9 http://www.defence.lk/new.asp?fname=Strict_actions_against_social_disharmony_creators_20140802_03 [accessed August 22, 2014]
10 http://srilankabrief.org/2014/07/12-northern-sri-lankan-tamil-journalists-impeded/ [accessed August 22, 2014]

පැවැත්වීමට සූදානම් කර තිබුණි. කෙසේ වුවත් 26 වන දින උදෑසන මෙම වැඩමුළුව පැවැත්වුවහොත් ආයතනයට පහර දෙන බවට තර්ජනය කරමින් රජය විසින් සංවිධානය කළ කලහකාරී කණ්ඩායමක් ශ්‍රී ලංකා පුවත්පත් ආයතන ගොඩනැගිල්ල ඉදිරිපිටට උද්ඝෝෂනයක් පැවැත් වීය. ඔවුන් විසින් වැඩමුළුව නවතා දැමීමට සංවිධායකයින්ට බල කෙරුණි. [11]



ජූලි 26 වන දින පාන්දර අසත්‍ය චෝදනා එල්ල කරමින් තමන් බිය ගැන්වීම පිළිබඳ ව ඔමන්තේ හිඳි විරෝධය පාන දෙමල ජනමාධ්‍යවේදීන් (ඡායාරූපය - ට්විටර්)

## 11. දෙමල ජනමාධ්‍ය වේදීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට විරුද්ධව කලහකාරී පිරිස් අනතුරු හඟවයි.

"ආයෙත් මේ වගේ වැඩමුළු පැවැත්වුව හොත් අපි නරක මිනිස්සු කියන්න එපා" යනුවෙන් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේදී පැවැත්වීමට සූදානම් කර තිබූ වැඩමුළුව කඩාකප්පල් කළ කළහකාරී කණ්ඩායමේ නායකයා විසින් තර්ජනය කරන ලදී. ඔහු මේ ප්‍රකාශය සිදු කරන ලද්දේ උතුරේ ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් පැවැත්වීමට සූදානම් කර තිබූ වැඩමුළුව සිහිපත් කරමිනි. රටේ කිසියම් හෝ ස්ථානයක මෙවැනි වැඩමුළු පැවැත්වුවහොත් ඒවා වැළැක්වීමට ඔවුන් ඒ ස්ථානයට පැමිණෙන බවත ඔහු තව දුරටත් අනතුරු හැඟවීය. මෙම ප්‍රකාශ, දෙමළ ජනමාධ්‍යවේදීන් ශ්‍රී ලංකාවේ කොතැනක හෝ මෙවැනි වැඩමුළු සඳහා සහභාගී වුවහොත් ඔවුන්ට විරුද්ධව ප්‍රචණ්ඩ හැසිරීමට පවා ඔවුන් සූදානම් බවට කළ පැහැදිළි අනතුරු හැඟවීමක් විය.[12]

---

[11] http://srilankabrief.org/2014/07/sabotage-of-media-workshop-and-death-threats-are-govt-orchestrated-slwja/#more-19122 [accessed August 22, 2014]
[12] http://srilankabrief.org/2014/07/dont-say-we-are-bad-boys-next-time-thugs-warn-to-slpi/#more-19126 [accessed August 22, 2014]




video වෙහි තිර දර්ශනය (ඡායාරූපය - SLB)

## 12. ජනමාධ්‍යවේදීන් පොලීසියට කැඳවයි

ජූලි 26 වන දින පැවැත්වීමට සූදානම් කර තිබූ ජනමාධ්‍ය වැඩමුළුව සඳහා පැමිණෙමින් සිටි තමන්ව හමුදාව විසින් බිය ගැන්වීමට විරුද්ධව විරෝධතාවයක නිරත වුණු උතුරු ජනමාධ්‍යවේදීන් ප්‍රශ්න කිරීම සඳහා ඕමන්තෛ පොලීසියට කැඳවනු ලැබීය. විරෝධතාවයේ නිරත වූ ජනමාධ්‍යවේදීන් 7 දෙනා මෙසේ ප්‍රශ්ණ කිරීම් සඳහා කැඳවා ඇති බව එක් මාධ්‍යවේදියෙකු සිය ට්විටර් පණිවුඩයක දක්වා තිබුණි.[13]

## 13. ජනමාධ්‍යවේදීන් බියගැන්වීම සහ ලුහුබැඳ යාම

නීති විරෝධීව රඳවාගෙන සිටින අලි පැටවුන් තිදෙනෙකු පිළිබඳ වාර්තා කිරීමට උත්සහ කළ ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට බිය ගැන්වීම්, තර්ජන සහ පහර දීම් වලට මුහුණ දීමට සිදු විය. පන්නිපිටියේ පිහිටි දෙවුරම් වෙහෙර නැමති පන්සලහි රඳවාගෙන සිටින අලි පැටවුන් තිදෙනා පිළිබඳ සොයා බැලීමට ජනරළ පුවත්පතෙහි මාධ්‍යවේදී ශාමල් ලියනාරච්චි සහ දිවයින පුවත්පතෙහි මාධ්‍යවේදී උදේනි චන්ද්‍රසිරි යන මහත්වරු ජූලි 18 වන දින අදාල පන්සල වෙත ගොස් ඇත. එහිදී පන්සලේ රැස්ව සිටි පිරිස් විසින් ශාමල් ලියනාරච්චි මහතාට තර්ජනය කර පන්සලෙන් එළවා දමා ඇති[14] අතර උදේනි චන්ද්‍රසිරි මහතාට ඔවුන් දමා ගැසූ ගල් පහරවල් වැදී තුවාල සිදු විය. උදේනි චන්ද්‍රසිරි මහතාව පසුව රෝහල් ගත කරන ලදී. මේ පිළිබඳ වාර්තා කිරීමට පැමිණි තවත් මාධ්‍යවේදීන් 10 දෙනෙකු මෙම පිරිස විසින් අවහිර කර ඇත.[15]

---

13 http://www.tamilguardian.com/article.asp?articleid=11670 [accessed August 22, 2014]
14 මූලාශ්‍ර - ජනරල පුවත්පතේ කර්තෘ සමග කළ සාකච්ඡාව , 2014 ජූලි 27 ජනරල පුවත්පතේ 3 පිටුව.
15 http://www.divaina.com/2014/07/19/news25.html [accessed August 22, 2014]

## 14. දෙමළ ජනයාගේ ඉඩම් අල්ලා ගැනීම පිළිබඳ වාර්තා කළ ජනමාධ්‍යවේදීන්ට තර්ජන

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කරනු ලබන මැනීම් කටයුතු නිසා දෙමළ ජනයාගේ පෞද්ගලික ඉඩම් තර්ජනයට ලක් වී ඇති බව ටැමිල් ගාර්ඩියන් පුවත් පත වාර්තා කළේය. රජය විසින් අත්පත් කර ගැනීමට සූදානම් වන දෙමළ ජනයාගේ පෞද්ගලික ඉඩම්වල මිනුම් කටයුතු කරමින් සිටි ශ්‍රී ලංකා නාවික හමුදාව ඡායාරූප ගත කිරීමට සහ ඒ පිළිබඳ වාර්තා කිරීමට උත්සහ කළ මාධ්‍යවේදීන්ට තර්ජන එල්ල වූ බව උදයන් පුවත්පත වාර්තා කළේය. මාධ්‍යවේදීන්ගේ ඡායාරූප ගනිමින් "මේ අපේ කළාපය. මෙහි ඡායාරූප ගැනීම තහනම්." යනුවෙන් නවික හමුදා නිලධාරියෙක් විසින් අනතුරු හඟවා ඇත.[16]

## 15. මන්නාරමේ ජනමාධ්‍යවේදියෙකුට තර්ජනය

මන්නාරමේ දෙමළ ජාතික ජනමාධ්‍යවේදියෙකු වන එස්.ආර් ලැම්බර්ට් මහතාට ශ්‍රී ලංකා පොලීසියේ ත්‍රස්ත විමර්ශන අංශය විසින් ජූලි මාසයේදී ද දිගින් දිගටම හිරිහැර පමුණුවන ලදී. සිංහලෙන් ලියැවුණු උපදෙස් සහිත ලිපියක් මගින් ජූලි 14 වන දා කොළඹ පිහිටි ත්‍රස්ත විමර්ශන අංශයේ පෙනී සිටින ලෙස ලැම්බර්ට් මහතා ට දැනුම් දී ඇත. ලැම්බර්ට් මහතාගේ විද්‍යුත් තැපැල් ගිණුමෙන් යැවුණු ප්‍රවෘතියක් ටැප් කර ඇති බව කියමින් දෙවැනි වතාවටත් ඔහුගේ විද්‍යුත් තැපැල් ගිනුමෙහි රහස්‍ය අංකය හෙළි කරන ලෙස ඔහුට දැනුම් දී ඇත. ලැම්බර්ට් මහතා පළමු වතාවට ත්‍රස්ත විමර්ශන අංශය විසින් ප්‍රශ්න කළේ 2013 වසරේ දෙසැම්බර් 09 වන දාය. ප්‍රශ්න කිරීම අතරතුරදී බුද්ධි අංශ නිලධාරීන් විසින් ලැම්බර්ට් මහතා විසින් වාර්තා කර ඇතැයි පවසමින් ප්‍රවෘත්ති වාර්තා 40ක් පමණ පෙන්වා ඇත. ඔහු විසින් දුරකතනෙයන් සම්බන්ධ වූ පුද්ගලයන්ගේ දුරකතන අංක ලැයිස්තුවක්ද ත්‍රස්ත විමර්ශන අංශයේ නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇත.[17]

## 16. ජනමාධ්‍යවේදීන් බිය ගන්වා අධිකරණයෙන් පිට මං කරයි

අවුරුදු 11 සහ 9ක් වන දෙමළ ගැහැණු ළමුන් දෙදෙනෙකුට කරෛනගර්හිදී සමූහ ස්ත්‍රී දූෂණකට ලක්කිරීම ජූලි 25 වන දින අධිකරණයේ විභාග වෙමින් තිබුණ අවස්ථාවෙහි දී ආරක්ෂක හමුදාවන් විසින් ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කර අධිකරණයෙන් පළවා හැර තිබුණි. මෙම ස්ත්‍රී දූෂණ සිදුවීම නාවික හමුදා පාලනය යටතේ සිදුවූවකි. සිවිල් ඇඳුමින් සැරසුණු ආරක්ෂක හමුදා නිලධාරීන් ජනමාධ්‍යවේදීන්ගේ කැමරා සහ ජංගම දුරකතන පැහැරගෙන ඡායාරූප මකා දමා ඇත. මේ සිදුවීම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රවෘත්තියක් පළ නොකරන මෙන් මාධ්‍යවේදීන්ට දැනුම් දී ඇති අතර නඩුවට අදාල ගැහැණු ළමුන්ගේ දෙමාපියන්ට මුදල් දීමට යෝජනා කර නඩුව අත හැර දමන ලෙස තර්ජනය කර ඇත . ශ්‍රී ලංකා නාවික හමුදාවේ 11 දෙනෙකු මෙම සමූහ ස්ත්‍රී දූෂණයට සම්බන්ධ වී ඇති බව කියැවේ.[18]

---

16 http://www.tamilguardian.com/article.asp?articleid=11529 [accessed August 22, 2014]
17 http://www.tamilnet.com/art.html?catid=13&artid=37303 [accessed August 22, 2014]
18 http://www.tamilguardian.com/article.asp?articleid=11637 [accessed August 22, 2014]

## 17. පසුගිය වසර කිහිපය තුළ ජනමාධ්‍යවේදීන්ට සිදුවූ ප්‍රහාර ආරක්ෂක හමුදා ප්‍රතික්ෂේප කරයි

අයිලන්ඩ් පුවත්පතේ පළවූ වාර්තාවකට අනුව “පසුගිය වසර කිහිපය තුළ ජනමාධ්‍යවේදීන්ට කිසිදු ප්‍රහාරයක් එල්ල වී නැතැයි”[19] යනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් කතා කරමින් ආරක්ෂක මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් රුවන් වනිගසූරිය මහතා ප්‍රකාශ කර ඇත. එම ප්‍රකාශයට හාත්පසින්ම වෙනස් ලෙස 2014 සහ ඊට පෙර වර්ෂ වලදී ජනමාධ්‍යවේදීන් වෙත නොයෙකුත් ආකාරයේ ප්‍රහාර ගණනාවක් එල්ල වී ඇති අතර බොහොමයක් සම්බන්ධයෙන් පොලිස් පැමිණිළි සටහන් කර ඇත. එවැනි ප්‍රහාර මෙම වාර්තාවේ සහ පසුගිය මාසවල “ශ්‍රී ලංකාවේ විසංමුතිය මර්දනය” වාර්තාවන්හිද සදහන් වී ඇත.

## 18. යාපනයේදී දෙමළ චිත්‍රපටයක් තර්ජනයට ලක් වේ

උතුරේ ජීවත්වන මිනිසුන්ගේ ජීවිත පිළිබද සකස් වූ චිත්‍රපටයක් වන “මාරු තදම්” චිත්‍රපටය පෙන්වීම යාපනය පොලීසිය විසින් කඩාකප්පල් කර දැමූ බව නිෂ්පාදක එස්. රමනන් මහතා මාධ්‍යයට කියා සිටියේය. පොලීසිය චිත්‍රපටය දර්ශන වූ ශාලාව වෙත ඇතුළු වී, චිත්‍රපටය සහ ප්‍රොජක්ටරය සමග රමනන් මහතාව ද පොලීසිය වෙත රැගෙන ගොස් ඇත. රමනන් මහතාව එදිනම නිදහස් කර යවා ඇතත් චිත්‍රපට ආම්පන්න නිදහස් කර නොමැත. නාඳුනන පුද්ගලයන් විසින් තමාට තර්ජනය කර බිය ගැන්වූ බවත් සහ තමාට බියෙන් ජීවත් වීමට සිදු වී ඇති බවත් රමනන් මහතා බීබීසී සිංහල සේවයට ප්‍රකාශ කර තිබුණි.[20] විධිමත් අවසරයක් ලබා නොගෙන චිත්‍රපටය දර්ශනය කිරීම හේතුවෙන් නිෂ්පාදකවරයාව අත්අඩංගුවට ගත් බවත් ඔහුට ඒ පිළිබද අනතුරු හඟවා ඔහුව නිදහස් කළ බවත් ආම්පන්න ඔහු වෙත පසුව ලබා දෙනු ඇති බවත් පොලීසිය ප්‍රකාශ කළේය. කෙසේ වෙතත් චිත්‍රපටය දර්ශනය කිරීම සඳහා අවසර ලබා ගැනීමට ජාතික චිත්‍රපට ආයතනය වෙත ගියත් එවැනි අවසරයක් අවශ්‍ය නොවන බව තමන්ට එහිදී දැනුම් දුන් බව රමනන් මහතා ප්‍රකාශ කර සිටියේය.

## 19. ආගමික පොලීසිය චිත්‍රපටකරුවෙකු පසුපස

කිසියම් ආගමික කණ්ඩායමක් විසින් ගොනු කරන ලද පැමිණිල්ලකට අදාළව ප්‍රකාශයක් ලබා දෙන මෙන් තමන්ගෙන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බව බෞද්ධ කටයුතු අමාත්‍යාංශයේ පිහිටි ආගමික ගැටුම් පිළිබද විශේෂ පොලිස් අංශයේ ප්‍රධානී නියෝජ්‍ය පොලිස් අධිකාරී වෙත ලිපියක් යොමු කරමින් චිත්‍රපටකරුවෙකු සහ ලේඛකයෙකු වන සිරිමල් විජේසිංහ මහතා කියා සිටියේ ය. “මෙය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය නින්දිත ලෙස උල්ලංඝණය කිරීමක්. චෝදනාවේ සඳහන් වන ආකාරයේ චිත්‍රපටයක් මා විසින් නිෂ්පාදනය කර නැහැ. නිකුත් කර ඇත්තේ චිත්‍රපටය පිළිබද මාධ්‍ය ප්‍රකාශයක් පමණයි. මාධ්‍ය ප්‍රකාශය නිකුත් කිරීමෙන් පසුව ආගමික අන්තවාදීන්ගෙන් එල්ල වූ තර්ජන නිසා මගේ ආරක්ෂාව සඳහා සැඟවී සිටින්නට සිදු වුණා.”[21] යැයි ඔහු තවදුරටත් කියා සිටියේ ය.

---

[19] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=107618 [accessed August 22, 2014]

[20] http://www.bbc.co.uk/sinhala/sri_lanka/2014/07/140728_lanka_ramanan_film.shtml [accessed August 22, 2014]

[21] http://srilankabrief.org/2014/07/religious-police-hunting-a-film-maker/ [accessed August 22, 2014]

## ඇ. රැස්වීමේ නිදහස නිදහස උල්ලංඝණය කිරීම

### 20. "තවත් කළු ජූලියක් එපා" ව්‍යාපාරයට පොලීසියෙන් බාධා

සම අයිතිය ව්‍යාපාරය විසින් ජූලි 23 වන දින දිවයින පුරා සංවිධාන කර තිබුණු දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවෙන් එකක් වූ කොළඹ 08 බොරැල්ලේ දී පැවැත්වුණු අත්සන් ව්‍යාපාරයකට පොලීසිය විසින් බාධා පමුණුවන ලදී. බොරැල්ල ප්‍රදේශයේදී සම අයිතිය ව්‍යාපාරය විසින් උදෑසන 9ට පමණ "තවත් කළු ජූලියක් එපා" නම් වූ වැඩසටහන ආරම්භ කර ඇති අතර එහිදී බොරැල්ල පොලීසියේ නිලධාරීන් පැමිණ වැඩසටහන නවත්වන ලෙස සහ ප්‍රචාරක දැන්වීම ඉවත් කරන ලෙස දන්වා ඇත. පසුව පොලීසිය විසින් ප්‍රචාරක දැන්වීම බලහත්කාරයෙන් ඉවත් කර ඇති අතර වැඩසටහන සංවිධානය කළ සම අයිතිය ව්‍යපාරයේ සාමාජිකයන් අත්අඩංගුවට ගැනීමට සූදානම් වී ඇත.[22] කළු ජූලිය යනුවෙන් හැඳින්වෙන්නේ දෙමළ පුරවැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය කරමින් ඔවුන්ගේ දේපල විනාශ කරමින් 1983 ශ්‍රී ලංකාවේ විවිධ පළාත් වල ඇවිලී ගිය ජාතිවාදී කොළහලයයි.

### 21. විරෝධතාවයකට සහය දීම හේතුවෙන් දෙමල දේශපාලඥයෙක් පීඩන වලට ලක් වේ

ඉඩම් සිය සිය ඉඩම මැනීමට මිනින්දෝරුවන් පැමිණීම සම්බන්ධයෙන් විරෝධතාවයේ යෙදුණු දෙමළ ජාතික මවකට තෙන්මරාච්චි ප්‍රාදේශීය සභාවේ සමාජිකයෙකු වන රාසයියා තෙයිවේන්ත්‍රම්පිලෛ මහතා සහය දීම නිසා ඔහුගේ බිරිද වෙත බුද්ධි අංශ සාමාජිකයන් විසින් තුවක්කුවක් එල්ලකර බිය ගන්වා ඔහුගේ දේපළ වලට ද හානි සිදු කර ඇත. යාපනය දිස්ත්‍රික්කයේ මිරුසුවිල් ප්‍රදේශයේ ඒ 9 මාර්ගයට යාබදව මේ සිදුවීමට අදාල ඉඩම පිහිටා ඇත. තෙයිවේන්ත්‍රම්පිලෛ මහතා විරෝධතාවයට සහභාගී වෙමින් සිටි අතරතුර කිසියකම් කණ්ඩායමක් ඔහුගේ නිවසට ඇතුළු වී ඔහුගේ බැංකු පොත් සහ ඉඩම් ඔප්පු වලට ගිණි තබා ඇත.[23]

### 22. යාපනයේ පැවැත්වීමට නියමිතව තිබූ ජාතික ධීවර සහයෝගීතාවයේ රැළියට තහනමක්

ජාතික ධීවර සහයෝගීතාවය (NAFSO) විසින් යාපනයේ දී සංවිධානය කළ විරෝධතා රැළියක් පොලීසියේ ඉල්ලීම මත අධිකරණය විසින් තහනම් කළේය. රජයට ලබා දී ඇති නිර්දේශ 10 ක්‍රියාත්මක කරන ලෙස බල කිරීමට සහ යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා වෙත පෙත්සමක් බාර දීම සඳහා මෙම ජූලි 15 වන දින යාපනය බස් නැවතුම්පළ ඉදිරිපිටදී මෙම විරෝධතා රැළිය පැවැත්වීමට සූදානම් කර තිබුණි. රැළිය මගින් මහජනතාවට අවහිරතා සිදුවිය හැකි බව දක්වමින් පොලීසිය විසින් මෙම අධිරකණ නියෝගය ලබා ගෙන තිබුණි. රැළිය පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් රැළියට සහභාගී වීමට පැමිණි සිය ගණනක් ජනයා යාපනය වීරසිංහම් ශාලාවේදී රැස්වීමක් පැවැත්වූහ.[24]

---

[22] http://www.lankaviews.com/en/index.php?option=com_content&view=article&id=11771:equal-rights-awareness-campaign-disrupted-by-police&catid=35:local&Itemid=48 [accessed August 22, 2014]
[23] http://tamilnet.com/art.html?catid=13&artid=37309 [accessed August 22, 2014]
[24] http://www.lankasrinews.com/view.php?22AOlv2acT5YAe4e4yMCc02aAmB3dd3PBmc30366AY2e4UY5f0ca2lOed3 [accessed August 22, 2014]



රථ පෙළිය තහනම් කිරීමෙන් නිසා ඒ වෙනුවට පැවැත්වුණු රැස්වීමට සහභාගී වූ ජනයාගෙන් කොටසක් (ඡායාරූපය- LankaSri)

## ඇ. සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම (රා.නො.සං. බියගැන්වීම සහ නීති පැනවීම)

### 23. රාජ්‍ය නොවන සංවිධාන වලට ජනමාධ්‍ය සම්බන්ධ කටයුතු තහනම් කිරීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලය නිකුත් කරන ලද චක්‍රලේඛනයකට[25] අනුව රාජ්‍ය නොවන සංවිධාන වලට මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම, මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සහ ජනමාධ්‍යවේදීන් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම තහනම් කර තිබේ. ශ්‍රී ලංකා නීතිඥ සංගමයට අනුව "මෙම චක්‍ර ලේඛනයේ අන්තර්ගතය සහ ඉන් ගම්‍ය වන කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සය වන පරිච්ඡේදයේ සඳහන් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම වලට පටහැනි වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන වගන්තියෙන් ලබා දී ඇති අදහස් ප්‍රකාශ කිරීමේ සහ භාෂණයේ නිදහස, එක් රැස්වීමේ සහ සමාගමයේ නිදහස, රැකියාවක නියැලීමට ඇති නිදහස උල්ලංඝණය කිරීමකි. මෙය වෙනත් කිසිවක් නොව සමාජය තුළ බිය වපුරවා ඒකාධිපති පාලනය තව තවත් ශක්තිමත් කිරීම සඳහා විකල්ප අදහස් නිහඬ කිරීමේ උත්සාහයකි."[26] කෙසේ වුවත් රාජ්‍ය නොවන සංවිධාන රාශියක් කොළඹදී පැවැත්වුණු විරෝධතාවයකදී මෙම චක්‍ර ලේඛනය ප්‍රසිද්ධියේ ගිණි තබා එය ප්‍රතික්ෂේප කරන ලදී.[27]

### 24. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන ජාතික ආරක්ෂාවට තර්ජනයක් යැයි අගමැති කියයි

යුධ සමයේදී ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන එල්.ටී.ටී.ඊ සංවිධානයට ආයුධ සහ මගපෙන්වීම් ලබා දී ඇති බව අග්‍රාමාත්‍ය දි.මු ජයරත්න මහතා ප්‍රකාශ කළේය. ඔහු මේ බව කියා සිටියේ ආරක්ෂක අමාත්‍යාංශයේ රා.නො.සං පිළිබඳ ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ චක්‍රලේඛනය සම්බන්ධයෙන් ඇති වූ මතභේදය පිළිබඳ ව ජූලි 11 වන දින පාර්ලිමේන්තුව අමතමිනි. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයෙන් ක්‍රියා කර ඇති බවට තොරතුරු බුද්ධි අංශ විසින් මෑතකදී සොයා ගෙන ඇති බව ඔහු එහිදී කියා සිටියේය.[28]

---

[25] http://srilankabrief.org/2014/07/sri-lanka-bans-ngos-engaging-in-public-communications-and-conducting-training/ [accessed August 22, 2014]
[26] http://srilankabrief.blogspot.com/2014/07/sri-lanka-basl-slams-mod-circular-to.html [accessed August 22, 2014]
[27] https://www.srilankamirror.com/news/16048-activists-burn-sri-lankan-warning-notice-to-ngos [accessed August 22, 2014]
[28] http://colombogazette.com/2014/07/11/some-ngos-armed-the-ltte-says-pm/ [accessed August 22, 2014]

## 25. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන බොහොමයක් කොටින්ට සහය දී ඇතැයි රාජ්‍ය මාධ්‍ය පවසයි

රාජ්‍ය පාලිත පුවත්පතක් වන සන්ඩේ ඔබ්සවර් පුවත්පත රාජ්‍ය නොවන සංවිධාන වලට පහර ගසමින් ලියූ ලිපියක 'ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන පරීක්ෂා කිරීමට රජය ගත් තීරණය ප්‍රසංසනීයයි.' යනුවෙන් සඳහන් කළේය. එය මෙසේ ද කීය: "ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන බොහොමයක් මිලියන භාගයක් පමණ සිවිල් වැසියන් නිදහස් කර ගත් රජයේ මානුෂීය මෙහෙයුම කාලයේදී මිනිස් ජීවිත පිළිබඳ කිසිදු අනුකම්පාවක් නොදැක්වූ කොටි ත්‍රස්තවාදීන්ට සහය දීම මගින් රටේ ප්‍රතිරූපය කෙලෙසෙන ආකාරයෙන් කටයුතු කර ඇත. විදේශ ආධාර වලින් තර වී සිටින සහ තලක්කට්ටුවේ සිට කෑගසන එන්ජීඕ මොඩයන් රට පාවා දීමට සූදානම් වී සිටියත්, ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන හික්මවීමට රජය ගත් මේ පියවර ඉතාමත් නිවැරදි තීරණයකි."[29]

## 26. ආධාර ලබා ගැනීමේ දී රාජ්‍ය නොවන සංවිධාන වලට නව සීමා

විදේශ ආධාර ලබා ගැනීමේදී සිය අමාත්‍යංශයෙන් පූර්ව අවසරයක් ලබා ගත යුතු බව මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යංශය සියළු රාජ්‍ය නොවන සංවිධාන වෙත දැනුම් දෙනු ලැබීය . එම 'දැන්වීම' ජාතික පුවත් පත් රාශියක පළ කළ දැන්වීමක් ලෙස පළ කරමින් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් ඕනෑම මූලයකින් ලැබෙන මුදල් ආධාර ප්‍රයෝජනයට ගැනීමේ දී නිසි සුපරීක්ෂාකාරීත්වයන් පවත්වා ගත යුතු බව සියළුම රජයේ ආයතන, දේශීය සංවිධාන, සිවිල් සංවිධාන සහ මහජනතාව යන සියළු දෙනා වෙත දැනුම් දෙන ලදී. මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීම, මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම සහ ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීම රාජ්‍ය නොවන සංවිධාන වලට තහනම් කරමින් ආරක්ෂක අමාත්‍යංශය විසින් මීට පෙර නිකුත් කළ මතභේදයට තුඩු දුන් චක්‍රලේඛනයට ඉතා සමීපව මෙම දැන්වීම පළ විය.[30] නීතිඥ වෘත්තිකයන්ගේ එකමුතුව ඒ සම්බන්ධයෙන් මෙසේ ප්‍රකාශ කළේ ය: “මෙම දැන්වීම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටීම මෙන්ම මහජනතාවගේ සමාජ ආර්ථික තත්වය නංවා ලීමට රාජ්‍ය නොවන සංවිධාන විසින් ලබා දෙන දායකත්වය පිළිබඳ ව මහජනතාවගේ සිත තුළ සැකයක් නිර්මාණය කිරීම සඳහා නීතිමය රාමුවෙන් පිට ක්‍රියාකරමින් සිවිල් සංවිධාන බිය ගැන්වීමට රජය යෙදූ තවත් එක් උපක්‍රමයකි. ආරක්ෂක අංශ යොදා ගනිමින් සිවිල් සංවිධාන පාලනය කිරීම සහ රාජ්‍ය නොවන සංවිධාන වල අධිවාචන ප්‍රයත්න උදාසීන කිරීම සඳහා වන රජයේ සැළසුම පිළිබඳ අනුමාන කිරීමට ප්‍රබල සාක්ෂි ඇත. මානව හිමිකම් , ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහ පරමාදර්ශයන් ප්‍රවර්ධනයට කිරීමට සිවිල් සමාජයෙන් ලැබෙන නිරන්තර දායකත්වය වළක්වාලීම සඳහා රජය විසින් අතිරේක අධිකරණ නිර්දේශ ලබා ගනිමින් සිටී. ඒකාධිපතිවාදය දෙසට වේගයෙන් ගමන් කරන රජයේ සාවද්‍ය තොරතුරු සහිත වැඩසටහන් වලට මුලා නොවන මෙන් නීතිඥ වෘත්තිකයන්ගේ සංගමය මහජනතාවගෙන් ඉල්ලා සිටී.”[31]

---

29 http://www.sundayobserver.lk/2014/07/13/main_Editorial.asp [accessed August 22, 2014]

30 http://www.dailymirror.lk/news/50038-no-foreign-funds-without-approval-ministry.html [accessed August 22, 2014].සම්පූර්ණ වාර්තාව සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය බලන්න. http://www.erd.gov.lk/files/ERD%20Final%20English.jpg [accessed August 22, 2014]

31 http://www.scoop.co.nz/stories/WO1407/S00260/sri-lanka-resources-department-misleading-public.htm [accessed August 22, 2014]

## 27. ඡන්ද දායකත්වය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වූ ආධාර ඉවත්කර ගැනීමට USAID ආයතනයට බලපෑම්

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමරිකානු ආයතනය (USAID) විසින් ඡන්ද දායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලබා දී තිබුණු ආධාර ශ්‍රී ලංකා රජයේ විරෝධය හේතුවෙන් අවලංගු කර ඇත. අයැදුම් කළ ආයතනවලට ජූලි 14 වන දින යවන ලද විද්‍යුත් ලිපියක "ශ්‍රී ලංකාවේ USAID කොළඹ කාර්යාලය මින් ඉදිරියට මෙම වැඩසටහන සඳහා අයදුම්පත් භාර නොගන්නා බව සලකන්න" යනුවෙන් සඳහන් විය. එදිනම, දිනපතා පුවත්පතක් සමග කළ සම්මුඛ සාකච්ඡාවකදී "ඡන්ද දායකයන් දැනුවත් කිරීම මගින් මැතිවරණ සඳහා සහය ලබා දීම " යටතේ ආධාර ලබා දීමට USAID විසින් පළ කරන ලද දැන්වීම පිළිබඳ අදහස් දක්වමින් එය "ශ්‍රී ලංකාවේ රජය හෑල්ලුවට ලක් කිරීමක්" බව ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ කියා සිටියේය. USAID ආධාර ලබන වැඩසටහන් රජයේ විමර්ෂණයට ලක් වනු ඇති බවද ආරක්ෂක ලේකම් වරයා එහිදී පැවසීය.[32]

# ඉ. විශ්ව විද්‍යාල ශිෂ්‍ය මර්දනය

## 28. ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්තඩංගුවට ගැනීම

මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා ඇතුළු ශිෂ්‍ය ක්‍රියාකාරීන් සිවු දෙනෙකු ජූලි 2 සහ 3 වන දිනයන් හිදී පොලීසිය විසින් අත්තඩංගුවට ගෙන ඇත. [33] මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය ප්‍රකාශ කළ පරිදි මෙම ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගෙන ඇත්තේ අධ්‍යාපන ආයතන තුළ නවක වදය සහ වෙනත් ප්‍රචණ්ඩ ක්‍රියා තහනම් කිරීමේ 1998 අංක 20 දරන පණත උල්ලංඝණය කිරීම යන චෝදනාව යටතේ ය.[34] විශ්ව විද්‍යාලයේ උපකුළපතිවරයාට අවහිර කිරීමේ චෝදනා යටතේ පොලීසිය විසින් තවත් ශිෂ්‍යයන් 31 දෙනෙකු මහේස්ත්‍රාත් ඉදිරියට පමුණුවා ඇති අතර එහිදී ඔවුන්ට මහේස්ත්‍රාත්වරයා විසින් ඇප ලබා දුන්නද ඇප ලබා දීමට පැමිණි ඥාතීන්ට මුහුණ දීමට සිදු වූ සීමාවන් හේතුවෙන් ශිෂ්‍යයන් 20 දෙනෙකු රිමාන්ඩ් භාරයට පත් විය. (මුලින් අත්අඩංගුවට ගත් තිදෙනාද මේ අතර වේ. ) [35] මේ ශිෂ්‍යයන්ට ඇප ලබා දීමට පැමිණි ඥාතීන්ට සිය ඥාතීත්වය තහවුරු කිරීමට පිණිස ග්‍රාම නිලධාරී සහතිකයක් ඉදිරිපත් කිරීමට සිදු විය. මේ අතර ඥාතීන්ට එවැනි ලිපි ලබා දීමට තමන් නීතියෙන් බැදී නොමැති බවත් මහේස්ත්‍රාත්වරයා විසින් එවැනි දැනුම් දීමක් කර නැති බවත් පවසමින් ඇතැම් ග්‍රාම සේවක නිලධාරීන් මා පියන්ගේ ඥාතීත්වය තහවුරු කරමින් ලිපි ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. දෙමාපියන් විසින් ඉදිරිපත් කළ ශිෂ්‍යයන්ගේ උප්පැන්න සහතික ද මෙහිදී නොසලකා හැර ඇති බව මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය තව දුරටත් කියා සිටියේය.

---

32 http://www.ft.lk/2014/07/05/us-axes-lankan-voter-education-funding-amid-controversy/ [accessed August 22, 2014]

33 http://www.lankaviews.com/sn/index.php?option=com_content&view=article&id=21131%3A2014-07-03-08-55-23&catid=100%3A2014-06-19-06-05-56&Itemid=151b [accessed August 22, 2014] and http://www.lankadeepa.lk/index.php/articles/247644 [accessed August 22, 2014]

34 මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානයේ ශිෂ්‍ය මර්ධනය පිළිබඳ මාසික වාර්තාව,ජූලි 2014. (Monthly Update on Repression of Students in Sri Lanka – July (2014), published by Students for Human Rights)

35 http://nethfm.com/article/24987/neth [accessed August 22, 2014](Sinhalese)

## 29. රජරට විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමය සහ පීඨ සංගමය විසුරුවා හරී

විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමය සහ පීඨ සංගමය තාවතාලිකව විසුරුවා හැරීමට රජරට විශ්ව විද්‍යාලයේ පාලන අධිකාරිය විසින් තීරණය කර ඇත. පසුගිය කාලයේදී සිදුවූ සිදුවීම වලට විරෝධය දැක්වීම සදහා ආචාර්යවරුන් පසුගිය සදුදා සිට විශ්ව විද්‍යාලයීය අධ්‍යයන සහ පරිපාලන කටයුතු වලින් වැළකී සිටීමට ගත් තීරණයෙන් පසුව ශිෂ්‍ය සංගම් තාවකාලිකව විසුරුවා හැරීමට තීරණය කළ බව උපකුළපති මහාචාර්ය විජේවර්ධන මහතා පැවසුවේය.[36]

## 30. ශිෂ්‍ය සත්‍යග්‍රහයට තවත් ප්‍රහාරයක්

ජූලි 10 වන දින උදෑසන රජරට විශ්වවිද්‍යාලයේ උපවාසයේ යෙදුණු ශිෂ්‍යයන්ගේ තාවකාලික කුටිය තෙවැනි වතාවටත් ගිණි තබා තිබුණි. වෑන් රථයකින් පැමිණි කණ්ඩායමක් විසින් උපවාසයේ යෙදුණු තාවතාලික කුටියට පෙට්‍රල් වත්කර ගිණි තැබූ බව රජරට විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකු වන ලසන්ත ප්‍රියංකර පැවසීය. කෙසේ වෙතත් උපවාසයේ යෙදුණු ශිෂ්‍යයන්ට ගින්නෙන් අනතුරක් වී නොමැත. ශිෂ්‍යයන් 28 දෙනෙකුගේ පංති තහනම ඉවත් කරන ලෙස විශ්ව විද්‍යාල අධිකාරීන්ට බල කරමින් පැවැත්වෙන මෙම උපවාසයට 2014 ජූලි 10 වන දිනට, දින 213 ක් සපිරී ඇත.[37]




ගිණිගත් තාවකාලික කුටිය (ඡායාරූපය - හිරු ප්‍රවෘත්ති)

[36] http://www.dailymirror.lk/news/49222-rajarata-uni-student-unions-dissolved.html [accessed August 22, 2014]
[37] http://www.hirunews.lk/87125/rajarata-uni-students-sathyagraha-hut-burnt-for-third-time [accessed August 22, 2014]

## ඊ එ.ජා පරීක්ෂණය වෙත සාක්ෂි දෙන පුද්ගලයන්ට එරෙහිව පියවර ගන්නා බවට තර්ජන

### 31. ස්කයිප් සහ විද්‍යුත් තාක්ෂණය ඔස්සේ සාක්ෂි ලබා දෙන පුද්ගලයන්ට විරුද්ධව "සුදුසු ක්‍රියාමාර්ග"

එක්සත් ජාතීන්ගේ යුධ අපරාධ පරීක්ෂණ කමිටුවේ ක්‍රියාකාරිත්වය ප්‍රතික්ෂේප කරමින් ශ්‍රී ලංකා රජය ඒ සඳහා ස්කයිප් හෝ වෙනත් විද්‍යුත් තාක්ෂණික ක්‍රම හරහා සාක්ෂි ලබා දෙන පුද්ගලයන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට තර්ජනය කර තිබුණි.[38]

## එ. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

### 32. විපක්ෂ දේශපාලන පක්ෂ කාර්යාලයට ප්‍රහාර

හාලි හැළ එක්සත් ජාතික පක්ෂ මැතිවරණ ප්‍රචාරක කාර්යාලයට ජූලි 3 වන දින ප්‍රහාරයක් එල්ල විය. මේ ප්‍රහාරය එල්ල වූයේ ඌව පළාත් සභාව විසුරුවා හැරීමට දින කිහිපයකට පෙරය. කැෆේ ආයතනය විසින් නිකුත් කළ වාර්තාවකට අනුව කිසියම් කල්ලියක් විසින් තාර සහ කසල තෙල් යොදා ගනිමින් හාලි ඇල එක්සත් ජාතික පක්ෂ කාර්යාලයට පහර දී ඇත. මේ සිදුවීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ ඌව පළාත් සංවිධායක සහ පළාත් සභා මන්ත්‍රී ජයන්ත කන්නන්ගර සහ පක්ෂයේ සාමාජිකයන් විසින් පොලීසියේ පැමිණිල්ලක් සටහන් කර ඇත.[39]

### 33. විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ගේ ගවේෂණ චාරිකාවට බාධා

සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ තොරතුරු සොයා බැලීමට ගිය එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ සේවකයන් පිරිසක් විසින් අවහිර කරන ලදී. "පොලීසියේ රැකවරණය ලැබූ සිය ගණනක් පිරිස පිවිසුම් දොරටුව අවහිර කළ බව" මෙම ස්ථානයේ සිටි එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා කියා සිටියේය. එක්සත් ජාතික පක්ෂ නියෝජිතයන්ගේ ගමන වැළැක්වීම සඳහා මෙම පිරිස පෙර සූදානමින් සිටි බව තවත් මන්ත්‍රී වරයෙක් කියා සිටියේය.[40]

### 34. සාම රැළියට ප්‍රහාර

"වර්ගවාදයට සහ ජාතිවාදයට විරුද්ධව ආරම්භ කළ සිය සාම රැළිය" ට එල්ල කළ ප්‍රහාරය හෙළා දකින බව එක්සත් සමාජවාදී පක්ෂයේ මහ ලේකම් සිරිතුංග ජයසූරිය මහතා මාධ්‍ය ප්‍රකාශයක් නිකුත් කරමින් පැවසීය. "පක්ෂ බේද සහ අනන්‍යතාවයන් නොසලකා සියළුම ආගම්, භාෂා සහ සුළුතර ජාතීන් පූර්ණ ගෞරවය සහ සමානාත්මතාවය භුක්තිවිදිමින් සමගියෙන් ජීවත් වන සාමකාමී, එක්සත්

[38] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=106183 [accessed August 22, 2014]
[39] http://www.sundaytimes.lk/140706/news/attack-on-unp-office-bodes-ill-for-uva-poll-105962.html [accessed August 22, 2014]
[40] http://www.asianmirror.lk/news/item/2074-unp-mps-prevented-from-entering-sapugaskanda-refinery/2074-unp-mps-prevented-from-entering-sapugaskanda-refinery [accessed August 22, 2014]

රටක් වෙනුවෙන් තමන් පෙනී සිටින බව ද ඔහු ප්‍රකාශ කළේය. 'අප සමාජයේ මෙම වටිනාවකම් කෙරෙහි එල්ල වන භෞතික සහ මතවාදීමය ප්‍රහාර හෙලා දැකීම සඳහා වර්ගවාදයට එරෙහිව එක්සත් සමාජවාදී පක්ෂය විසින් කොළඹ නාරහේන්පිට සිට අළුත්ගම දර්ගා නගරය දක්වා දිවෙන යතුරුපැදි රැලියක්' ආරම්භ කරන ලදී." ජූලි 26 වන දින අළුත්ගම ප්‍රදේශයේදී මේ රැළියට ප්‍රහාර එල්ල විය.[41]




සිරිතුංග ජයසූරිය ඉදිරිපය යාම සඳහා පොලීසියෙන් අවසර ඉල්ලා සිටින ආකාරය (ඡායාරූපය- ඩේලි මිරර් )

[41]http://srilankabrief.org/2014/07/an-injury-to-one-is-an-injury-to-all-lets-fight-the-racism-communalism/#more-19212 [accessed August 22, 2014]